නිකවැරටිය ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය
----------------------------------

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 17 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 අගෝස්තු 25 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 <u>මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ වටිනාකම රු.4,924,339 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.4,602,213 ක් ලෙස දැක්වීම මත වර්ෂයේ ආදායම හා ආදායම් ණයගැතියන් රු.322,126 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල මුද්දර ගාස්තු ආදායම රු.7,543,251 ක් වුවද, ආදායම් හා වියදම් ගිණුමෙහි එය රු.6,935,139 ක් ලෙස දැක්වීම මත වර්ෂයේ ආදායම රු.608,112 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයේ වා මුවාව හානි වීම වෙනුවෙන් ලද රු.152,903 ක රක්ෂණ වන්දිය විවිධ ආදායම් (3/61) ලෙස ගිණුම්ගත කිරීම මත වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් හා දෙසැම්බර් මාස වෙනුවෙන් ලැබිය යුතු රු.1,334,084 ක උසාවි දඩ ආදායම්, ණයගැතියන් ලෙස ගිණුම්ගත නොකිරීම මත වර්ෂයේ ආදායම හා ණයගැතියන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාලව ලැබිය යුතු රු.369,031 ක බදු කුලී ආදායම ලැබිය යුතු ආදායම් ලෙස හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම මත වර්ෂයේ ආදායම හා ආදායම් ණයගැතියන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) 2009 හා 2012 වර්ෂවල පෙර ගෙවුම් ක්‍රමයට (කීමනී) ටෙන්ඩර් කල බස් නැවතුම්පල කඩ 18 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය වන විට අය වීමට තිබූ රු.5,611,440 ක ප්‍රමාණය ණයගැතියන් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂයට අදාලව අවසාන ශේෂය යටතේ ගිණුම් විෂයයන් 06 කට අදාලව ගිණුම අනුව සහ අදාල ලේඛන අතර රු.1,012,024 ක නොසැසඳීම් පැවතුණි.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ලැබිය යුතු ගිණුම් තුල රු.10,657,404 ක මුද්දර ගාස්තු ශේෂයක් හා 2011 සිට 2013 වර්ෂ දක්වා ලැබිය යුතු රු.7,570,789 ක කර්මාන්ත ණයගැති ශේෂයක් ද විය.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 63,304,821 ක් විය. ඒ තුල පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.3,018,916 ක ශේෂයක් ද, රු.2,800,140 ක පෙර ගෙවුම් මුදල් (කීමනී) ශේෂයක් හා 2010 සිට 2013 වර්ෂ දක්වා කාල පරිච්ඡේදයට අදාලව ගෙවිය යුතු රු.8,492,684 ක කර්මාන්ත ණයහිමි ශේෂයක් ද විය.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසන් වන විට වර්ෂ 02 ත් 10 ත් අතර කාලයක සිට පැවත එන රු.828,989 ක් වූ මස්කඩ,මාළුකඩ තැන්පත් ශේෂ 90 ක් පමණ පැවති අතර එය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම නිසා එකතුව රු.2,474,870 ක ගනුදෙනු පිළිබඳව විස්තරාත්මක පරීක්ෂාවක් කළ නොහැකි විය.

02 මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම් අතිරික්තය රු.3,601,130 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.9,170,998 ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.5,569,868 ක පසුබෑමක් පැවතුණි. මෙකී මෙහෙයුම් ප්‍රතිඵලයට රු.26,225,973 ක් වූ ප්‍රාග්ධන ආධාර හා රු.19,917,450 ක් වූ ප්‍රාග්ධන වැය ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රතිඵලය රු.9,909,653 ක අතිරික්තයක් විය.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.57,438,412 න් දළ වශයෙන් සියයට 71 ක් ලෙස රු.40,833,173 ක්ම උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි ලැබීම්වලින් සමන්විත විය. එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.26,225,973 ක මුළු ප්‍රමාණයම ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභවයන් මත වෙනත් ආයතන මගින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලද මුදල්වලින් සමන්විත විය.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල මුළු පුනරාවර්තන වියදම වූ රු.53,837,282 න් දළ වශයෙන් සියයට 57 ක් ලෙස රු.30,627,606 ක් පෞද්ගලික පඩිනඩි සඳහා වියදම වූ අතර ඉන් දළ වශයෙන් සියයට 82 ක් ලෙස රු.25,294,970 ක් වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන කොමසාරිස් විසින් ලබා දී තිබුණි. එම වටිනාකම වෙනත් ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණි. එමෙන්ම ප්‍රාග්ධන වියදම වූ රු.19,917,450 න් දළ

වශයෙන් සියයට 59 ක් ලෙස රු.11,783,600 ක් පළාත් නිශ්චිත, දොරින් දොරට වැනි ප්‍රභව මත වෙනත් ආයතන ප්‍රතිපාදන වලින් ඉටු කල සංවර්ධන කාර්යයන්ට ලද මුදල් විය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,571,604 ක වරිපනම් බදු හිඟයක් පැවති අතර එය වාර්ෂික බිල් කිරීම් වලින් සියයට 63 ක් පමණ විය. එමෙන්ම සභාව සතුව වරිපනම් ඒකක 1964 ක් පමණ පැවතියද 2014 වර්ෂය තුල ඒකක 271 කට පමණක් හිඟ නිවේදන නිකුත් කර ඉන් ඒකක 88 කට පමණක් රතු නිවේදන නිකුත් කර තිබුණි.

2.3.2 බදු කුලී

අවම ලංසුව රු.239,400 ක් වූ මස්කඩ 02 ක් හා මාළුකඩ 02 ක් සමාලෝචිත වර්ෂය තුල බදු දීමට නොහැකි වී තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසානයට වත්කම් 04 ක් වෙනුවෙන් රු. 575,416 ක හිඟ ශේෂයක් ද පැවතුණි. එමෙන්ම 2014 වර්ෂයේ බදු දුන් වත්කම් 02 ක් වෙනුවෙන් අයකල යුතු රු.5,460 ක ප්‍රමාද ගාස්තුවක් ද අයකර ගෙන නොතිබුණි.

2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ රු.1,334,084 ක්ද මුද්දර ගාස්තු රු. 10,657,404 ක්ද විය.

2.3.4 පෙර ගෙවුම් මුදල්

බස් නැවතුම්පල කඩ කාමර එකවර ගෙවන මුදල් ක්‍රමයට ලබා දීමට අදාලව පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) බස් නැවතුම්පලේ පහත මාලයේ කඩ කාමර 18 ක් අවම ලංසුවල එකතුව රු.9,562,000 කට 2009 වර්ෂයේදී ටෙන්ඩර් කර තිබූ අතර ඉන් අවම ලංසුවල එකතුව රු. 8,850,000 ක් වූ කඩ කාමර 17 ක් සඳහා ටෙන්ඩර් පිළිගෙන තිබුණි. ටෙන්ඩර පිළිගත් බව දැනුම් දීමේ ලිපිය අනුව ටෙන්ඩර් මුදලින් සියයට 40 ක් මුලින් ගෙවා ඉතිරි සියයට 60 මාස 05 ක් ඇතුලත ගෙවා නිම කලයුතු බව දක්වා තිබුණද, මේ සම්බන්ධව අදාල පාර්ශව සමග ලිඛිත ගිවිසුමකට එළඹ ඇති බවට සාධක නොතිබුණි.

(ආ) 2009.07.27 දින බදුකරු සමග එකඟ වූ ලිපිය පරිදි රු.1,923,000 කට ටෙන්ඩර්ගත වූ අංක 03, 06 සහ 15 කඩ කාමර සඳහා කිසිදු මුදලක් අය වී නොතිබුණි.

(ඇ) ටෙන්ඩර් කොන්දේසි අනුව අදාල එකවර ගෙවන මුදල් (කී මනී) මාස 05 ක් ඇතුලත ගෙවා අවසන් කල යුතු වුවද ටෙන්ඩර් කර වසර 05 කට වැඩි කාලයක් ගත වී ඇතත් 2014 දෙසැම්බර් 31 වන විටද අංක 1,7,8,10,11,12,14,16,17 දරන කඩ වෙනුවෙන් රු. 1,417,690 ක එක්වන් මුදලක් අය වීමට පැවතුණි.

(ඈ) බස් නැවතුම්පලේ ඉහල මාලයේ කඩ කාමර 12 ක් 2009 වර්ෂයේ ටෙන්ඩර් කල ද එක් කඩ කාමරයක් හෝ බදුගෙන නොතිබුණි. 2012 ජූලි මාසයේදී මෙම කඩ කාමර බදු දීම සඳහා අවම ලංසුව රු.7,000,000 කට නැවත ටෙන්ඩර් කර තිබුණි. ටෙන්ඩර් කොන්දේසි අනුව ටෙන්ඩර් මුදලින් සියයට 50 ක් දින 21 ක් ඇතුලත හා ඉතිරි මුදල් දින 90 ක් ඇතුලත ගෙවා අවසන් කල යුතු වුවද, ටෙන්ඩර් කර වසර 02 කට වැඩි කාලයක් ගතවී ඇතත් 2014 දෙසැම්බර් 31 වන විටද කඩ කාමර 06 ක් වෙනුවෙන් රු. 2,270,750 ක එකවර ගෙවන මුදල අය වීමට තිබුණි.

03. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 <u>අවිධිමත් ගනුදෙනු</u>

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශයට පටහැනිව මිල ගණන් 3 ක් පමණක් පදනම් කරගෙන 2014 වර්ෂය සඳහා අවස්ථා 03 කදී රු. 692,790 ක විදුලි උපකරණ ලබාගෙන තිබුණි.

(ආ) 2014 අගොස්තු සිට දෙසැම්බර් දක්වා සභාවේ මෝටර් ග්‍රේඩරය හා පිටතින් ලබාගත් මෝටර් ග්‍රේඩර් 10 ක් එක් ගමකට එක් වැඩක් වැඩ සටහන සඳහා යොදවා තිබූ අතර, ඉන්ධන ලේඛණ අනුව මෙම මෝටර් ග්‍රේඩර් යන්ත්‍ර සඳහා සභාව විසින් ඉන්ධන ලීටර් 18,838 ක් සපයා තිබුණද, එම යන්ත්‍රවල කල වැඩ ප්‍රමාණයන් පිලිබද ප්‍රමාණවත් තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම මත සභාව විසින් ඉන්ධන සඳහා දරා ඇති රු.2,200,000 කට වැඩි මුදල් සඳහා ප්‍රමාණවත් තහවුරුවක් ලබා ගැනීමට නොහැකි විය.

3.2 <u>කොන්ත්‍රාත් පරිපාලනය</u>

3.2.1 <u>දොරින් දොරට - ගමින් ගමට 2014 වැඩසටහන</u>

දොරින් දොරට - ගමින් ගමට වැඩ සටහන - 2014 යටතේ සභා බල ප්‍රදේශයේ මාර්ග සංවර්ධනය කිරීම සඳහා මාර්ග 36 ක් වෙනුවෙන් රු.15,000,000 ක මුදලක් වෙන් වී තිබුණි.

(i) විගණිත දිනය වූ 2015 මාර්තු 20 වන විට ප්‍රතිපාදන මුදලින් සියයට 27 ක් පමණ වූ රු. 4,050,000 ක් වටිනා කර්මාන්ත 08 ක් පමණක් නිමකර තිබුණි. එමෙන්ම ප්‍රතිපාදිත මුදලින් සියයට 15 ක් පමණ වූ කර්මාන්ත 04 ක වැඩ ආරම්භ කර තිබුණ ද ප්‍රතිපාදිත මුදලින් සියයට 58 ක් පමණ වූ රු. 8,750,000 ක් වටිනා කර්මාන්ත 24 ක් ඉටුකර නොතිබුණි.

(ii) රු.1,000,000 ක ප්‍රතිපාදන මත බණ්ඩාරනායක මාවත සංවර්ධනය කිරීමේ කර්මාන්තය සඳහා ගොවි සංවිධානයක් සමඟ 2014 දෙසැම්බර් 21 ගිවිසුම් ගතව තිබුණි. 2014 දෙසැම්බර් 29 දින පලමු හා දෙවන වැඩ කොටස් සඳහා කොටස් ගෙවීම් වාර්තාවක් පිලියෙල කර තිබුණ ද ඉන් ඉදිරියට කිසිදු ප්‍රගතියක් වාර්තා වි නොතිබුණි. 2015 මාර්තු 21 වන විට ගිවිසුම් කාලය අවසන් වුවද අදාල මාර්ගය නිමකර නොමැති බවත් ABC මිශ්‍රණය ඇතිරීම පමණක් සිදුකර ඇති බවත් 2015 මාර්තු 20 දින සිදුකල භෞතික පරික්ෂාවේදී නිරීක්ෂණය විය.

3.2.2 <u>එක් ගමකට එක වැඩක් වැඩසටහන 2014</u>

කොටවෙහෙර, නිකවැරටිය හා රස්නායකපුර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ සඳහා රු. 47,123,500 ක් එක ගමකට එක වැඩක් වැඩ සටහන යටතේ වෙන්කර තිබුණි.

එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරි වසම් 78 ට අදාලව මාර්ග 727 මෝටර් ග්‍රේඩර් කිරීමට ඇස්තමේන්තු කර එක් එක් ග්‍රාම සේවා වසම සඳහා මුදල් වෙන්කර තිබුණි. ඊට අදාල කර්මාන්ත ලිපිගොනු නිසි පරිදි නඩත්තු කර නොතිබු අතර නිම කල වැඩ ප්‍රමාණයන්, යොදා ගත් මෝටර් ග්‍රේඩර් පැය ගණන හා ගෙවීම් පිලිබද තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.

04 <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරනය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය